දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2016 පරීක්ෂණය (2014 පුනර්) - 2017 පෙබරවාරි/මාර්තු
First Examination in Arts (External) 2016 (Repeat 2014) – February/March 2017

ඉප්‍ර 1.1 - ශ්‍රී ලංකාවේ ඉතිහාසය (ආරම්භයේ සිට ක්‍රි.ව. 1500 දක්වා)
HY 1.1 – History of Sri Lanka (From the beginning to 1500 AD)

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ

---

01. මහසෙන් රජුගේ පාලන සමය අවසානය දක්වා ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය හැදෑරීමේ ඓතිහාසික මූලාශ්‍රයක් වශයෙන් මහාවංශය වැදගත්වන ආකාරය පහත දැක්වෙන මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.
   i. මහාවංශයේ දැක්වෙන සිද්ධීන් අභිලේඛනමය මූලාශ්‍ර මගින් සනාථ වීම
   ii. මූලාශ්‍රයක් වශයෙන් මහාවංශයේ වැදගත්කම හා දුර්වලතා

02. දේවානම්පියතිස්ස රජුගේ පාලන සමයේ ආගමික හා සංස්කෘතික වැදගත්කම සාකච්ඡා කරන්න.

03. අනුරාධපුර රාජධානියේ පිරිහීමට හා එහි බිඳ වැටීමට තුඩුදුන් හේතු විග්‍රහ කරන්න.

04. රජරට ශිෂ්ටාචාර අවධියේ වාරිමාර්ග ක්‍රමයේ ඇතිවූ වර්ධනය පහත සඳහන් අංශ ඇසුරෙන් පරීක්ෂා කරන්න.
   i. වැව් ඉදිකිරීමේ ක්‍රමික වර්ධනය
   ii. වාරි තාක්ෂණය

05. නිශ්ශංකමල්ල රජතුමා මුහුණ දුන් අභියෝග සැකෙවින් දක්වා ඔහු එම අභියෝග ජයගත් අන්දම සාකච්ඡා කරන්න.

06. "පොලොන්නරු යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය සහ චිත්‍ර කලාව සිංහල කලාකරුවාගේ නිපුනත්වය ප්‍රකට කරවයි" විමසන්න.

07. **<u>එක්කෝ</u>**
   මෙරට නිරිත දිග රාජධානි සමයේ ඉදි වූ නිර්මාණ තුළින් හෙලිවන විදේශීය බලපෑම ඇගයීමකට ලක් කරන්න.
   **<u>නැතහොත්</u>**
   දඹදෙනි යුගය ශ්‍රී ලංකාවේ දේශපාලන හා සංස්කෘතික ඉතිහාසයෙහිලා වැදගත්වන අයුරු විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

08. "හයවන පරාක්‍රමබාහු රාජ්‍ය සමය මෙරට පැරණි ඉතිහාසයේ අවසන් දීප්තිමත් රාජ්‍ය සමයයි" සාකච්ඡා කරන්න.